**සීමා සහිත නාවික හා ගුවන්සේවා තොරතුරු හා පර්යේෂණ (පුද්) සමාගම - 2015**

---

සීමා සහිත නාවික හා ගුවන්සේවා තොරතුරු හා පර්යේෂණ (පුද්) සමාගමේ 2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 පිහිටුවීම හා සමාගමේ අයිතිය

---

නාවික හා ගුවන්සේවා තොරතුරු හා පර්යේෂණ (පුද්ගලික) සමාගම 2009 ජූලි 10 දින 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලදී. එවකට තිබූ ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන්කිරීමේ කාර්යාංශය ඇවර කර ඊට අයත්ව තිබූ සියලුම වත්කම් හා බැරකම් මෙම සමාගම වෙත පවරා තිබුණි. කෙසේ නමුත් සමාගමේ සම්පූර්ණ ප්‍රාග්ධන හිමිකම මහා භාණ්ඩාගාරය සතුව තිබුණි.

**1.5 සමාගම ඇවර කිරීම**

2012 වර්ෂයේ සිට සමාගම අඛණ්ඩව අලාභ ලබා තිබුණු අතර ස්ථාවර තැන්පතු ආයෝජන මත ලැබුණු පොලී ආදායම හැරුණු විට සැලකියයුතු වෙනත් මෙහෙයුම් ලාභයක් සමාලෝචිත වර්ෂය දක්වා උපයා නොතිබුණි. තවද 2016 අගෝස්තු 31 දින අමාත්‍ය මණ්ඩලය විසින් මෙම සමාගම තවදුරටත් පවත්වාගෙන යාම අර්ථාන්විත නොවන බැවින් ඇවර කිරීමට තීරණය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.2 යටතේ හෙළිදරව් කර තිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1. මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 මාර්තු 31 දිනට නාවික හා ගුවන්සේවා තොරතුරු හා පර්යේෂණ (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බැංකු සනාථ කිරීම් අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ස්ථාවර තැන්පතු වටිනාකම රු.27,047,362ක් වුවද මූල්‍ය ප්‍රකාශනයන්හි එය රු.26,913,457ක් ලෙස දැක්වීම හේතුවෙන් ස්ථාවර තැන්පතු වටිනාකම රු.133,905ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ලද පොලී ආදායම මත අයකළ රු.209,937ක්වූ රඳවා ගැනීමේ බදු ගිණුම්වලින් අත් හැරී තිබුණි.

**2.2.2 පැහැදිලි නොකල වෙනස්කම්**

ලෙජර් ගිණුම් අනුව උපචිත වියදම රු.578,328 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.652,184 ක් වූයෙන් රු.73,856 ක වෙනසක් පැවතුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වසර 03 කට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතු ලෙස ගිණුම්වල දක්වා තිබුණු ස්ථාවර තැන්පතු පොළී ආදායම මත බැංකුව විසින් රඳවා ගෙන තිබුණු රු. 930,355 ක් වූ රඳවා ගැනීමේ බදු මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණු අතර නැවත අයකර ගැනීම ද අවිනිශ්චිතව පැවතුණි.

(ආ) වසර 03 කට වැඩි කාලයක් තිස්සේ ගෙවියයුතු වියදම් ලෙස ගිණුම්වල දක්වා තිබුණු එකතු වටිනාකම රු. 518,333ක් වූ ශේෂ දෙකක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ 2014 ජුලි 25 දිනැති අංක එස්ඊසී/2014/05 දරන චක්‍රලේඛය | සමාගම විසින් සභාපතිවරයාගේ පාරිශ්‍රමිකයෙන් උපයනවිට ගෙවීමේ (PAYE) බදු අඩුකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා 2011 සැප්තැම්බර් 15 දිනැති අංක 58(2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් 06 දෙනෙකුට හා සමාගම ප්‍රධාන සේවා යෝජකයා නොවන වෙනත් නිළධාරීන් තිදෙනෙකුට දීමනා ගෙවීමේදී පූර්වෝක්ත චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව සියයට 10 ක් වූ රඳවා ගැනීමේ බදු (WHT) අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 වගන්තිය | තොග හා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් වාර්ෂිකව භෞතික සත්‍යාපනයක් සිදු කළ යුතු වුවත් සමාගම විසින් 2014/2015 මූල්‍ය වර්ෂය වෙනුවෙන් වාර්ෂික භෞතික සත්‍යාපනය සිදුකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාගමේ සමාලෝචිත වර්ෂයේ අලාභය රු.2,071,909 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.878,942 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,192,967 කින් හෙවත් සියයට 136 කින් පිරිහී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් ආදායමක් උපයා නොතිබීම සහ ආයෝජන පොළී ආදායම රු.1,804,806 කින් අඩුවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2010/2011 ගිණුම් වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සමාගම අඛණ්ඩව අලාභ ලබා තිබුණු අතර වාර්ෂිකව අලාභය වැඩි වෙමින් පැවතුණි. එසේම සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී 2010/2011 ගිණුම් වර්ෂයේ රු.1,053,517 ක ධන අගයක් වූ දායකත්වය 2014/2015 ගිණුම් වර්ෂයේදී රු.656,365 ක ඍණ අගයක් වී පැවතුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සමාගමේ පරිපාලන හා මූල්‍ය වියදම සියයට 18 කින් අඩුවී තිබුණු අතර ස්ථාවර තැන්පතු සඳහා පැවති පොලී අනුපාතය සියයට 12.75 සිට සියයට 7.5 දක්වා අඩුවීමත්, සමාලෝචිත වර්ෂයේදී රු. 1,501,142 ක ස්ථාවර තැන්පතු උපලබ්ධි කිරීම හේතුකොට ගෙන ස්ථාවර තැන්පතු මත ලැබුණු පොලී ආදායම සියයට 51කින් අඩුවී තිබුණි.

(ආ) සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ලෙස ස්ථාවර තැන්පතු වල ආයෝජිත රු.30,000,000 ක මුදල සමාගමේ පරිපාලන හා මූල්‍ය වියදම් දැරීම සඳහා ස්ථාවර තැන්පතු උපලබ්ධි කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු.26,913,457 ක් දක්වා එනම් සියයට 10 කින් අඩුවී තිබුණු අතර ආයතනය දිගින් දිගටම පාඩු ලැබීම හේතුවෙන් සමුච්චිත අලාභය ගැලපූ පසු ආයතනයේ හිමිකම රු.25,221,887 දක්වා එනම් සියයට 16 කින් අඩු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

## 4.1 කාර්යසාධනය

-------------------

සමාගමේ ප්‍රධාන අරමුණු සංක්ෂිප්තව පහත දැක්වේ.

- මුහුදු හා ගුවන් මගින් සිදුකරනු ලබන ආනයන, අපනයන කටයුතුවලට අදාල දත්ත හා තොරතුරු රැස්කිරීම, බෙදාහැරීම, විශ්ලේෂණය සහ පර්යේෂණ සිදුකිරීම, එවැනි කටයුතු ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපාර සිදුකිරීම සහ අදාල අමාත්‍යවරයා විසින් කලින් කලට නියමකරනු ලබන එවැනි කටයුතු සිදුකිරීම.

- මුහුදු හා ගුවන් මගින් සිදුකරනු ලබන ගමනාගමන කටයුතුවලට අදාල දත්ත හා තොරතුරු රැස්කිරීම, බෙදාහැරීම, විශ්ලේෂණය සහ පර්යේෂණ සිදුකිරීම, එවැනි කටයුතු ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපාර සිදුකිරීම සහ අදාල අමාත්‍යවරයා විසින් කලින් කලට නියම කරනු ලබන එවැනි කටයුතු සිදුකිරීම.

- මුහුදු මගින් හා ගුවන් මගින් සිදුකරනු ලබන ගමනාගමන, ආනයන හා අපනයන කටයුතු ආශ්‍රිතව දත්ත හා තොරතුරු රැස්කිරීම හා බෙදාහැරීම ලාභ ඉපයීමේ පදනමින් සිදුකිරීම.

- වරාය, නාවික හා ගුවන්සේවා ක්ෂේත්‍රයන්ට අදාල පර්යේෂණ කාර්යයන්, ලාභ ඉපයීමේ පදනමින් බාරගැනීම හා සිදුකිරීම.

- ආනයන, අපනයන හා ඊට සම්බන්ධිත ක්ෂේත්‍රයන්හි පුහුණුකිරීම් හා උපදේශාත්මක සේවා ව්‍යාපාර සිදුකිරීම.

- ඉහත අරමුණුවලට අදාල පුහුණුකටයුතු, දේශණ, සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම සහ මානව සම්පත් සංවර්ධන වැඩසටහන් සම්පාදනය පිළිබඳ ව්‍යාපාර සිදුකිරීම.

ඉහත අරමුණු ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී සමාගම විසින් සිදු කිරීමට යෝජිත පර්යේෂණ කාර්යයන් 09 ක් හා සමාලෝචිත වර්ෂය තුළ විවිධ ආයතන සම්බන්ධ පර්යේෂණ යෝජනා 07 ක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් වී තිබුණද එම කිසිදු යෝජනාවක් ක්‍රියාත්මක තත්ත්වයට පත්කර නොතිබුණි.

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉකුත් වර්ෂවලදී අනුමතකර තිබුණු සමහර පර්යේෂණ යෝජනා සමාගම පිහිටුවීමේ අරමුණින් බැහැර පර්යේෂණ කටයුතු බව නිරීක්ෂණය වූ අතර එවැනි පර්යේෂණ යෝජනා කිහිපයක් පහත දැක්වේ.

- (i) රාජ්‍ය සංවර්ධනය මහජනතාව කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ පර්යේෂණය.
- (ii) ජයවර්ධනපුර රෝහල භාවිතා කරන්නන්ගේ තෘප්තිය පිළිබඳ පර්යේෂණය.
- (iii) සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත "හෝම් ස්ටේ කන්ස්සෙප්ට්" පිළිබඳ පර්යේෂණය.
- (iv) ලංකා බැංකුවේ පාරිභෝගික තෘප්තිය සම්බන්ධ පරීක්ෂාව.
- (v) ජනාධිපතිවරණය පිළිබඳ මත විමසීමේ පරීක්ෂාව.

(ඇ) බන්ධනාගාරය තුළ තිබිය යුතු පහසුකම් වර්ධනය පිළිබඳ පර්යේෂණයක් සිදුකිරීම සඳහා 2013 වර්ෂයේදී රු.545,000 ක අත්තිකාරම් මුදලක් ලබාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම පර්යේෂණය අවසන් කර වාර්තාව නිකුත් කර නොතිබුණි. බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙතින් තොරතුරු ලබා ගැනීමේදී පැවති අපහසුතා හේතුවෙන් පර්යේෂණය අවසන් කළ නොහැකි වූ බව අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වාර්තා කර තිබුණි.

(ඈ) අනුමත වාර්ෂික ක්‍රියාකාරී සැලස්මක් අනුව නිශ්චිත ඉලක්ක පිහිටුවා නොතිබීම හා සැලසුම් සහගතව කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී සමාගම කිසිදු මෙහෙයුම් කාර්යයක් තුළින් ආදායමක් උපයා නොතිබුණි..කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂයේදී සමාගමේ කාර්ය මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වැටුප් සහ දීමනා ලෙස රු. 2,361,377 ක් ගෙවා තිබුණි.

### 4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

සමාගමේ කොටස් ප්‍රාග්ධනය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් සපයන ලද රු.30,000,000 ක ස්ථාවර තැන්පතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් රු.26,000,000 ක තැන්පතු ඇපයට තබා රු.3,000,000 ක බැංකු අයිරාවක් ලබාගෙන තිබුණි. මෙම බැංකු අයිරාව සමාගමේ පුනරාවර්තන වියදම් ගෙවීම සඳහා උපයෝජනය කර තිබුණු අතර තවදුරටත් දැරිය යුතු වූ වියදම් සඳහා ස්ථාවර තැන්පතුවෙන් රු. 1,501,142 ක් උපලබ්ධි කර වැයකර තිබුණි.

### 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය 07 දෙනෙකු වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 03 දෙනෙකු වීමෙන් පුරප්පාඩු 04 ක් පැවතුණි.

(ආ) සමාගමේ මූලික අරමුණ නාවික හා ගුවන් පරිවහනයට අදාල තොරතුරු රැස් කිරීම, බෙදාහැරීම හා පර්යේෂණ සිදුකිරීම වුවත් ඒ සඳහා අනුමත වූ පර්යේෂණ නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීම් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපොහොසත්ව තිබුණි.

## 4.4 සේවක පාරිතෝෂික සඳහා අරමුදලක් ගොඩනැගීම

සමාගම විසින් සේවක පාරිතෝෂික ගෙවීම් සඳහා අනාගත බැදියාව වෙනුවෙන් ආයෝජන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මාස 16 කට අධික ප්‍රමාදයකින් පසු 2016 ඔක්තෝබර් 11 දින ඉදිරිපත් කර තිබුණු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2016 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

### 5.2 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව ඉදිරි වර්ෂ 03 ක කාලය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලයේද එකඟතාවය සහිතව අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළයුතු වුවත් 2014 සිට 2017 වර්ෂ සඳහා වූ සංයුක්ත සැලැස්ම හා 2014/2015 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අනුමත කර නොතිබුණි.

### 5.3 විගණන හා කළමනාකරණ කමිටු

2010 දෙසැම්බර් 14 දිනැති අංක පීඊඩී/55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව විගණන කමිටු අවම වශයෙන් සෑම මාස තුනකට එක් වරක්වත් රැස්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 03ක් පමණක් පවත්වා තිබුණි. කෙසේ වෙතත්, සමාගමේ අභ්‍යන්තර පාලනය, මූල්‍ය හා මෙහෙයුම් කළමනාකරණය සම්බන්ධයෙන් පූර්වෝක්ත කමිටු වලින් අපේක්ෂිත වගකීම් ඉටුවූයේද යන්න ගැටලු සහගත වී තිබුණි.

### 5.4 අභ්‍යන්තර විගණනය

අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත බාහිර ආයතනයක නිලධාරියකු අභ්‍යන්තර විගණන කටයුතු සඳහා බඳවාගෙන මාසයකට රු.5,000 බැගින් ගෙවීම් කර තිබුණද විධිමත් විගණන වැඩසටහනක් අනුව අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු විය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | විධිමත් පරිදි මූලික පොත්පත් හා ජර්නල් සටහන් පවත්වා නොගැනීම. |
| (ආ) | මානව සම්පත් කළමනාකරණය | විධිමත් පරිදි සේවක පුරප්පාඩු නොපිරවීම. |
| (ඇ) | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් නොකිරීම. |
| (ඈ) | මෙහෙයුම් පාලනය | සමාගම පිහිටුවීමේ අරමුණට අනුගතව කාර්ය සාධනයක් නොතිබීම. |